# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය<br>Date | 2025.12.03<br>පැය 0550 | දුරකථන අංකය<br>Tel.NO | 011-2887973 | මගේ අංකය<br>My NO | D/Media/Out/2160 /2025 | විද්‍යුත් ලිපිනය<br>E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීමේ අපරාධයකට ආධාර අනුබල දුන් සැකකරුවෙකු හා සැකකාරියක් හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට - ඇල්පිටිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2025.11.28 වන දින මීටියාගොඩ පොලිස් වසමේදී පුද්ගලයෙකුට පිස්තෝල වර්ගයේ ගිනි අවියකින් වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමට තැත් කිරීමේ අපරාධය සම්බන්ධයෙන් ඇල්පිටිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය මඟින් විමර්ශනයක් ආරම්භ කර තිබිණි.

ඒ අනුව විමර්ශන නිලධාරීන්ට ලද තොරතුරක් මත 2025.12.02 වන දින කුරුවිට පොලිස් වසමේදී ඉහත අපරාධයේ වෙඩික්කරු හට අපරාධය සිදු කිරීමට ප්‍රවාහන පහසුකම් ලබා දෙමින් ආධාර අනුබල දුන් සැකකරුවෙකු හා සැකකාරියක් හෙරොයින් ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 40 ක් සමග අත් අඩංගුවට ගෙන මීටියාගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකාරිය වයස අවුරුදු 27 ක් වන හෙන්ගමුව ප්‍රදේශයේ පදිංචිකාරියක් වන අතර සැකකරු වයස අවුරුදු 41 ක් වන උණවටුණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීටියාගොඩ පොලිසිය  වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක්, ජීව උණ්ඩ හා හෙරොයින් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - මීටියාගොඩ පොලිස් ස්ථානය.**

2025.12.02 වන දින දහවල් කාලයේදී මීටියාගොඩ පොලිස් වසමේ ඩොමී ජයවර්ධන මාවත ප්‍රදේශයේදී මීටියාගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර විදේශීය රටක නිෂ්පාදිත රිවෝල්වරයක්, එම ජීව පතරොම් 04ක් හා හෙරොයින් ග්‍රෑම් 14 මිලිග්‍රෑම් 900ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 36 ක් වන වාලච්චේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීටියාගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය තොගයක් පොලිස් භාරයට - පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශය.

2025.12.02 වන දින දහවල් කාලයේ පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශයට ලද තොරතුරක් මත බේරුවල පොලිස් වසමේ බාබේරියන් දූපතේ කැලෑ ප්‍රදේශයක් තුල සඟවා තිබූ **අයිස් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 04 මිලිග්‍රෑම් 260 ක් පොලිස් භාරයට ගෙන බේරුවල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.**

**සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා බේරුවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.**

## 04. මාරක රිය අනතුරක් - මාවනැල්ල පොලිස් වසම.

2025.12.02 වන දින සවස් කාලයේ මාවනැල්ල පොලිස් වසමේ කොළඹ නුවර මාර්ගයේ නායවල ප්‍රදේශයේදී මාර්ගය අයිනේ ගමන් කල පදික පුද්ගලයෙකු මෝටර් රථයකින් හප්පා පලාගොස් ඇති අතර අනතුරින් පදික පුද්ගලයා තුවාල ලබා මාවනැල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 75 ක් වූ ලිදුල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාවනැල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදු කල අතර මෙය වෑන් රථයකින් සිදුවූ අනතුරක් බවට අනාවරණය වී ඇති අතර අදාල වෑන් රථය හා රියදුරු අත්අඩංගුවට ගැනීම සඳහා මාවනැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - මහව පොලිස් වසම.

2025.12.02 වන දින උදෑසන කාලයේ මහව පොලිස් වසමේ මහව නාගොල්ලාගම මාර්ගයේ වීහේනේගම ප්‍රදේශයේදී මහව දෙස සිට නාගොල්ලාගම දෙසට ධාවනය වූ යතුරුපැදියක් අතුරු මාර්ගයකට හැරවීමට යාමේදී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි වෑන් රථයක ගැටී වෑන් රථය නවතා තිබූ පාපැදියක, තාප්පයක හා දුරකතන රැහැන් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු හා වෑන් රථයේ රියදුරු තුවාල ලබා මහව රෝහලට ඇතුලත් කිරීමෙන් පසුව යතුරුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 60 ක් වූ ජනපයපුර,මහව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මහව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මහව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - අනුරාධපුර පොලිස් වසම.

2025.12.02 වන දින උදෑසන කාලයේ අනුරාධපුර පොලිස් වසමේ දුටුගැමුණු මාලිගාව ආසන්නයේදී ලෝලුගස්වැව වටරවුම දෙස සිට තිසාවැව දෙසට ධාවනය වූ යතුරුපැදියක් අතුරු මාර්ගයක සිට ප්‍රධාන මාර්ගයට ඇතුල් කල යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරුවන් දෙදෙනා අනුරාධපුරය රෝහලට ඇතුලත් කිරීමේදී එක් යතුරුපැදියක පැදිකාරිය මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 43 ක් වූ කටුකැලියාව, අනුරාධපුරය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය අනුරාධපුරය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනුරාධපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - අරලගංවිල පොලිස් වසම.

2025.12.02 වන දින සවස් කාලයේ අරලගංවිල පොලිස් වසමේ නෙළුම්වැව ප්‍රදේශයේදී නෙළුම්වැව දෙස සිට බොරවැව දෙසට ධාවනය වූ යතුරුපැදියක් ඊට ඉදිරියෙන් ගමන් කල ත්‍රීරෝද රථයක පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු වැලිකන්ද රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 15 ක් වූ නෙළුම්වැව, පොලොන්නරුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වැලිකන්ද රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අරලගංවිල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**